පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

සතිය -

විෂය - චිත්‍ර විෂය

ශ්‍රේණිය - 6

සැකසුම - උපුලී චතුරානි ධර්මසේන

මාවනැල්ල අධ්‍යාපන කලාපය

## 3.2.1. ද්විතීක වර්ණ භාවිත කර තෑගි දවටනයක් නිර්මාණය කරමු.

ද්විතීක වර්ණ හඳුනා ගනිමු.

1. තැඹිලි
2. කොළ
3. දම්




**<u>තෑගි දවටනයක් නිර්මාණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය :-</u>**

බ්‍රිසිල් බෝඩ්, පැස්ටල්, කතුරක්

**<u>නිර්මාණය කරන ආකාරය</u>**

- වෘත්තය, සමචතුරස්‍රය, සෘජුකෝණාස්‍රය, ත්‍රිකෝණය යන හැඩ සුදුසු පරිමාණයකට කපා ගන්න.

මෙහිදී **ටෙම්ප්ලේට් මුද්‍රණ ක්‍රමය** භාවිත කරයි.

(එනම්, අච්චුවක් වටේ පැස්ටල් තවරා ඇතුළට හෝ පිටතට ඇදීමේ ශිල්ප ක්‍රමයයි.)

- අච්චුව වටේ ද්විතීක වර්ණ තවරා සුදු කඩදාසිය මත තබා ශිල්ප ක්‍රමය භාවිත කරන්න.



කපා ගත් හැඩතල කෙළවර ද්විතීක වර්ණ මාරුවෙන් මාරුවට හොඳින් ආලේප කරන්න.



- වර්ණ කරන ලද හැඩතල කඩදාසිය මත තබා වටේට ඇඟිල්ලෙන් පිරි මැද හැඩයේ ඇති වර්ණ කඩදාසිය මත තවරා ගන්න.
- කඩදාසිය මත සමබරව ව්‍යාප්ත කරන්න.
- මුද්‍රණය කර ගත් හැඩතලයේ මැද කොටසෙහි දියසායම් හෝපැස්ටල් මාධ්‍ය භාවිත කර මලක් වැනි හැඩයක් අඳින්න.